# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2470/18 - 2026 ජනවාරි මස 05 වැනි සඳුදා - 2026.01.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 32(2) වගන්තිය සමග කියවිය යුතු 157(1) වගන්තිය යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පනවන ලද රීති.

විනිසුරු **ඩබ්. එම්. එන්. පී. ඉද්දවල,**
සභාපති.

**කේ. බී. රාජපක්ෂ,**
කොමසාරිස්.

ජනාධිපති නීතිඥ **චේතිය ගුණසේකර,**
කොමසාරිස්.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව.

2025 දෙසැම්බර් මස 24 වැනි දින දී ය.

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26 (4), (5), (8), සහ (9) වගන්ති යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් ට අදාළ රීති**

මෙම රීති 2026 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මක වේ.

මෙම රීති මගින් ආවරණය නොවන ඕනෑම කරුණක් පිළිබඳ අර්ථනිරූපණ සහ තීරණ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධි විධාන වලට යටත්ව කොමිෂන් සභාව විසින් ගනු ලැබිය යුතුය.

1A - PG 7453 — 04 (2026/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*රීති*

1. මෙම රීති, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26 (4), (5), (8), සහ (9) උප වගන්ති යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් සම්බන්ධයෙන් පනතේ 32 (1) වගන්තියේ කාර්යයන් සඳහා අදාළ රීති ලෙස දැක්විය හැකිය.

2. කොමිෂන් සභාව විසින් විශේෂිතව තීරණය කරනු ලබන කරුණු සම්බන්ධයෙන් හැර, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ ප්‍රතිපාදන වලට අනුකූල නොවන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ ඊට අදාළව කලින් කලට පසුව නිකුත් කළ හා කරනු ලබන චක්‍රලේඛ මගින් සිදු කරන ලද සංශෝධනවල විධිවිධාන මෙන්ම අදාළ නිලධාරීන් සහ සේවානියුක්තයන් සම්බන්ධව නිකුත් කරනු ලබන රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස් වලට ද ඊට අදාළ වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනයන් මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එවැනි යම් නිලධාරියකු පත්කිරීමේ අධිකාරියක් මගින් නිකුත් කළ රීති, රෙගුලාසි, නියෝග හා කාර්ය පටිපාටි ද, පනතේ 26 (4), (5), (8) සහ (9) උපවගන්ති යටතේ කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් සම්බන්ධයෙන් පනතේ 32(1) වගන්තියේ කාර්යයන් සඳහා අදාළ වේ.

3. මෙම රීතිවල ;

   i. "පනත" යන්නෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත අදහස් වේ.

   ii. "කොමිෂන් සභාව" යන්නෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 3 (1) වගන්තිය යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අදහස් වේ.

   iii. ආයතන සංග්‍රහයේ "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යන්නෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 17 (1) වගන්තිය අනුව පනත යටතේ පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය කිරීම සඳහා කොමිෂන් සභාව වෙත පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

EOG 01 - 0038

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.